SERENDIB Lanka Travels
Gateway to Serendipity
COLOMBO From £305 + TAX
INDIA From £345 + TAX
FAR EAST From £385 + TAX
WOW Unbeatable Offer
Sea Freight From £10 a Tea Chest
1 Olympic way, Wembley HA9 0NP
Tele: 020 8782 1140 - Fax: 020 8782 1134
email: info@serendib-lanka.co.uk

CORGI Registered Central Heating Engineer
Reliable, friendly. Any work not too small.
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
සුහද, එමෙන් ම විශ්වාසවන්ත සේවය
නාමල් NAMAL 0 7 9 5 8 7 2 0 9 1 2

ලෙච්වර්ත් විහාරස්ථානය මගින් මෙහෙයවනු ලබන
2008 බක්මහ උළෙල
අවුරුදු චාරිත්‍ර ජන ක්‍රීඩා හා දේශීය නැටුම් ගැයුම්
මෙහිදී දේශාභිමානී රණවිරු උපහාර ගී ගැයෙන අතර ඔවුන්ගේ චිත්ත ශක්තිය වැඩුමට සිදුකෙරෙන විශේෂ වැඩපිළිවෙලක සමාරම්භයද සිදුකෙරේ. පැමිණ අප හා එක්වන ලෙස ඔබට කෙරෙන කාරුණික ආරාධනයයි
අප්‍රියෙල් 12 වන සෙනසුරාදා
උදේ 10.00 සිට සවස 6 .30 දක්වා
Wilbury Junior School
Bedford Road, Letchworth SG6 4DU
Letchworth Buddhist Viharaya - 01462 641326

සිංහළ අවුරුදු උළෙල
නැගණහිර ලන්ඩනයේ නිවිහැම්හි
16 වන වරටත් උත්කර්ෂවත් අන්දමින්
අප්‍රියෙල් 20 ඉරිදා දහවල් 2 - 6 දක්වා පැවැත්වේ
PLASHET GIRLS SCHOOL
PLASHET GROVE
LONDON E6
ළමා හා වැඩිහිටි ජන ක්‍රීඩා, අවුරුදු කුමාරි තරඟය නැටුම් ගැයුම් පිරි සංස්කෘතික සන්ධ්‍යාව ප්‍රනීත භෝජන සංග්‍රහයක් නොමිළේ
ඔබ සැමට ආරාධනා
නැගණහිර ලන්ඩනයේ සිංහළ සුබ සාධක සංගමය

# ප්‍රභාකරන් අධ්‍යක්ෂකට මදුරාසියේදී පහර දෙති



*මදුරාසි රෝහලේ දී පිටේ මැහුම් සමග*

ශ්‍රී ලංකාවේ තරුණ චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකු වන තුෂාර පීරිස්ගේ කුළුඳුල් සිනමා නිර්මාණයේ නම ප්‍රභාකරන්ය. එය දෙමළ කොටි ත්‍රස්තවාදය සහ යුද්ධයේ බිහිසුණුකම ගැනත්, ළමා සොල්දාදුවන් බඳවා ගැනීමත් වටා ගෙතුණු කතා පුවතකි. එම චිත්‍රපටයේ දෙමළ පිටපතේ හඬ කැවීම සඳහා දළසේයාපටද රැගෙන තුෂාර දැන් චෙන්නායි නමින් හැඳින්වෙන දකුණු ඉන්දියාවේ මදුරාසියේ ජෙමිණි සිනමා රසායනාගාරයට ගිය 20 දා ගියේ ය. ඔහු එහි යන විට ඒ චිත්‍රපටය ගැන ඉන්දියාවේ පත්තරවල විවිධ දේ ලියැවී තිබිණ. ඉන් කියැවුණේ එය ප්‍රභාකරන් සහ කොටි සංවිධානය අවමානයට ලක් කරන්නටත් ලංකා රජය හා හමුදා ඔසවා තබන් නටත් සාදා ඇති චිත්‍රපටයක් බවය. මදුරාසියේ කොටි පාක්ෂිකයන් හා දේශපාලකයන් ජෙමිණි රසායනාගාරය ඉදිරියේ කැගසන්නට වූහ.

තුෂාර වැඩ නිමවා රසායනාගාරයෙන් එළියට ආ විට විරෝධය පෑ අය ඔහු වෙතට කඩාගෙන එද්දී තුෂාර ආපසු රසායනාගාරය වෙතට දිව්වේය. පසුපස හඹා ආ මැරවරයෝ තුෂාරට සිහිනැතිවන තුරු පහරදුන්හ. පොලීසිය ඔහු රෝහලට ගෙනගොස් ඇත. දැන් ප්‍රභාකරන් චිත්‍රපටයේ සේයාපට තුෂාරට දිය නොහැකි බව ජෙමිණි රසායනාගාරය කියයි. ඔහුට පහරදුන් අය අතර තමිල්නාඩු ඇමතිවරයෙකු ද සිටියි.

***කේ. එල්. කරුණාරත්න* Sri Lanka**

## ♥ පැටියො ඩාලිං



" පැටියො දැන් සමහරු අහනවා ඇයි ලංකා රජයට තවම ප්‍රභාකරන් අල්ලගන්න බැරිවුණේ කියලා.....

" ඒ කවුරුවත් අහන්නෙ නැහැ නේද ඇයි ඇමරිකාවට තවම බින් ලාඩන් අල්ල ගන්න බැරිවුණේ කියලා....."

# Sinhala Lesson 120 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Present Participle - මිශ්‍ර ක්‍රියාව

In our last lesson, we explained Present Participles.

**Father is sitting there writing a letter.**

පියා ලියුමක් ලියමින් / ලියලිය එහි වාඩිවී සිටියි

**Father is sitting there writing a letter while drinking tea.**

පියා තේ බොමින් / බිබී ලියුමක් ලියමින් / ලියලිය එහි වාඩිවී සිටියි

You will see that the words ලියලිය/ ලියමින්, බිබී, බොමින් are **Present Participles.** These are formed either by adding the suffix, මින් to the verb base. බො+මින්=බොමින් ලිය+මින්=ලියමින් or by duplicating the verb base බො /ලිය

**Here are more examples:-**


| Verb base | Adding sufix | Duplicating Verb base | |
|---|---|---|---|
| බල | බල+මින් = බලමින් | බල බලා | while looking |
| ක | ක+මින් = කමින් | කකා | " eating |
| කර | කර+මින් = කරමින් | කරකර | " doing |
| වෙ | වෙ+මින් = වෙමින් | වෙවී | " happening |
| කප | කප+මින් = කපමින් | කපකප | " cutting |

♦ ආචාර්ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 97

**හරහට :**
1 කැත වචන
5 දරුවන් නොලැබෙන ගතිය
6 කේන්ද්‍රය කියන අගුණ
8 හැම දේකටම ඇත.
9 විනාස වුණු
10 අවහිර

**පහළට :**
2 දළදා වඩින්නට මෙහි යමු
3 විවාහයේදී ඉල්ලා සිටිති
4 මැණික් ගන්නට කපති
6 වෙහෙස මහන්සිය
7 සමහර කාන්තාවෝ අඳිති



***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට:** 1 කතුර 5 නිවාස 6 දිසාව 8 වියගහ 9 ආස 10 තර
**පහළට:** 1 කනිටු 2 තුවා 3 රසදිය 4 ජනවහර 7 සාගත 8 විස

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# අවුරුදු බිබික්කන්

## New Year Bibikkan

### උදාවන සිංහළ අළුත් අවුරුද්ද සඳහා

***අවශ්‍ය ද්‍රව්‍ය :***
පොල් ගෙඩි 2 ක් ( බැයක් කිරි සඳහා )
පැණි බෝතලයක් හෝ හුණ්ඩු 2 ක්
පිටි රාත්තල් ¼ ක්
රට ඉඳි රාත්තල් ½ ක්
කජු ගෙඩි 25 ක්
වියලි මිදි සෑහෙන පමණ
කරඳමුංගු සහ මාදුරු තේ හැඳි 2 ක්
බේකිං පවුඩර් තේ හැඳි ½ ක්
කුරුඳු කුඩු තේ හැඳි ¼ ක්
වැනිලා තේ හැඳි 1 ක්
බිත්තර 1 ක් (අවශ්‍ය නම් )

***සාදන ක්‍රමය :*** පොල් හීනියට ගා ගන්න. පැණි ලිපේ තබා එය උණු වේගන එන විට ඊට පොල් දමා මලවා ගන්න. පොල් තද දුඹුරු පැහැය එනතුරු ලිප උඩ මැලවෙන්නට හරින්න. තෙත ගතිය තිබෙද්දී ලිපෙන් බා ගන්න, නිවෙන්නට තබන්න. පිටි පොල්වලට මිශ්‍ර කරන්න. සිහින්ව කපා ගත් රට ඉඳි, කජු, වියලි මිදි, ඇතුළු අන් සියල්ල ද, බේකිං පවුඩර්ද එයට එක් කර හොඳින් මිශ්‍ර කර පොල් බැයක කිරි ද ඊට එකතු කරන්න. මිශ්‍රණය තෙත් ගතිය මදි නම් හොඳින් ගසන ලද බිත්තරයක් ද එක් කොට පැයක් පමණ උදුනක දවාගන්න. ( bake in oven )

♦ ***රන්ජනී බන්දුසීල*** **Edgware, Middx, UK**

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432